# An exploratory study of the problems encountered in the implementation of the official school curriculum

## පාසල් නිල විෂයමාලව ප්‍රායෝගිකත්වයට නැගීමෙහිදි ඇතිවන ගැටලු පිළිබද විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

පාසල් විෂයමාලාවෙහි අන්තර්ගත කරුණු ප්‍රායෝගිකත්වයට නැගීමෙහිලා යම් යම් දුර්වලතා පවතින බව හැගීයයි. සිසුන්ගේ හැසිරීම් අධ්‍යයනය කිරීමෙන් චරිතායන අධ්‍යාපනය තවදුරටත් සංවර්ධනය විය යුතු මට්ටමක පවතින බව පැහැදිලිය. පාසල හා ඉන් පරිබාහිරව සිසුන් තුළ පවතින සමාජානුයොජනය නොවූ හැසිරීම් පාසල හා සමාජයට පද්ධතියක් ලෙස ගැටලු ඇතිකරවන මට්ටම දක්වා වර්ධනය වී ඇත. පාසල් නිල විෂයමාලාව තුළින් යහපත පුරවැසියන් බිහිකර ගැනීම දිගුකාලීන පරමාර්ථය වේ. එකී පරමාර්ථ උදෙසා සියලු විෂයයන්ගෙන් උත්සාහා දරනු ලැබේ. එහි දී බුද්ධ ධර්මය විෂය සදචාරාත්මක බව ඇතිකිරීමට ප්‍රමුඛ දයකත්වයක් සපයන බව එහි අරමුණු හා නිපුනතාවලින් ගම්‍ය වේ. උක්ත කරුණු අධ්‍යයනය සදහා ශ්‍රි ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක දෙකක 1 සී වර්ගයේ පාසල් දෙකක උදෑසන ආගමික වතාවත් ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි. ඒ සදහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ජා, නිරීක්ෂණ හා ලේඛණගත දත්ත යොදගන්නා ලදී. තොරතුරුවල නිරවද්‍යතාව හා විශ්වසයතාව ආරක්ෂා කිරීම සදහා දත්ත ත්‍රිකෝණිකරණය කරන ලදී. එහි දී පහත සදහන් අනාවරණයන් වඩාත් සුවිශේෂී විය. සිසුන්ගේ චරිත සංවර්ධනය සදහා සියලු ගුරුවරුන්ගේ අවධානය නොමදව ලැබිය යුතු අතර එය විනය භාර ආචාර්යවරුන්ට පමණක් භාරකිරීම සුදුසු නොවන බවත් යහපත් සමාජානුයොජනය සදහා දැනුම පමණක් ලබාදීම ප්‍රමාණවත් නොවන අතර ප්‍රායොගිකව ක්‍රියාකාරකම්වල යොදවීම අත්‍යවශ්‍ය වී ඇත. සිසු ආකල්ප වර්ධනය වීමට එය බෙහෙවින් බලපානු ඇත. සදචාරාත්මක වර්ධනය කෙරෙහි නිවසෙහි පවතින පරිසය හා සංස්කෘතිය බෙහෙවින් බලපාන අතර එය සිදු වන්නේ සිමිත සිසු පිරිසක් සදහා පමණි. ඒ නිසා නිල විෂයමාලාවේ අන්තර්ගය ප්‍රායෝගිකත්වයට නැගීමට නිවසින් ද වැඩි දයකත්වයකි ලබාදීම ඉතා වැදගත්ය. සමාජයේ ඍණාත්මක විය යුතු ආකල්ප ධනාත්මකව සැලකීම තවදුරටත් සිදු නොවිය යුතු අතර එය සිසුන්ගේ සමාායෝජනය සදහා වැරදි ලෙස බලපැනු ඇත.

ප්‍රමුඛ පද - සමාජානුයෝජනය, සදචාරය, පාසල් නිළ විෂයමාලාව, චරිතායනය, බුද්ධ ධර්මය විෂය.